35 වන පිටෙන්




එයට පසුව තවත් වාහනයක් පැමිණියේය. එම වාහනයෙන් සංවිධානයේ නායකතුමා වන ප්‍රභාකරන් මහතා සහ තවත් සහයකයෝ කීපදෙනෙක් පැමිණියහ. මහත් ගම්භීර ලෙස සිනාමුසු මුවින් යුතුවූ ඔහුගේ පැමිණීම අපි විශ්මයට පත්ව මුවාවී බලාගෙන උන්නෙමු. පොත්පත් සහ පුවත්පත්වලින් මෙන්ම පසුව සංවිධානයට බැඳුණු වැඩිහිටි සාමාජික සාමාජිකාවන්ගෙන් ඔහු පිළිබඳ ඇති පුවත් රාශියකට සවන් දී ඇති නමුත් ඇස් පනාපිට මේ තරම් ළඟින් නායකතුමාව දැකගැනීමට ලැබෙනු ඇතැයි මම සිහිනෙන්වත් නොසිතුවෙමි.

සටන්කාමී සහෝදරියෝ විශාල සංඛ්‍යාවක් සම්බන්ධ වූ ප්‍රහාරය ලෙස ඒ වන විට අලිමංකඩ ප්‍රහාරය වැදගත්ය. මාසයකටත් වඩා අධික කාලයක් දිග්ගැස්සුණු එම ගැටුමේදී සටන්කාමීහු විශාල සංඛ්‍යාවක් ජීවිතක්ෂයට පත්වූ අතර තුවාල ලැබූ සහ ආබාධිත වූ සංඛ්‍යාවද විශාලය. නායකතුමා පැමිණ සිටියේ එසේ ආබාධිත වූ සටන්කාමී සහෝදරියන්ව හමුවීමටයි. අපි සියලු දෙනාටම තේ පැන් සංග්‍රහය සිදු කළෙමු. එම සටන්කාමී සහෝදරියෝ මහත් සතුටින් නායකතුමා සමඟ සිනාමුසුව කතාබහේ යෙදුණහ. තම වගකීම් භාර සටන්කාමීන් සමඟ සහ සෙන්පතිවරුන් සමඟ කතා කරන විට ඇති බිය නායකතුමා සමඟ කතා කරන විට නොමැතිවීම මට විස්මයට හේතුවක් විය. පවුලේදී අම්මා තාත්තා සමඟ කතා කරන්නාක් මෙන් ඔවුහු මහත් ලෙන්ගතුව කතාබස් කළහ. ඔවුහු 'අණ්ණා' (අයියා) යනුවෙන් නායකතුමාව අමතමින් තම ගැටලු ඉදිරිපත් කළහ.

ආබාධිත වූ තම සහෝදරියන්ට ගැලපෙන වැඩපිළිවෙළක් සකස් කර ඔවුන්ව එහි නිමග්න කරවීම එම සාකච්ඡාවෙහි අරමුණ වූ බව එහිදී සිදුවූ සංවාදවලින්ද පසුව දියත් කෙරුණු වැඩසටහන්වලින්ද අවබෝධකර ගැනීමට හැකිවිය. රැස්වීම අවසානයේ නායකතුමා පිටත්ව යාමට සූදානම්ව එක්වරම අපේ වගකීම්භාර සහෝදරියව කැඳවා 'අනෙක් ළමයින්ට පොඩ්ඩක් එන්න කියන්න' යැයි පැවසුවේය. එතෙක් වේලා සැඟවී බලාගෙන සිටි අපි නායකතුමාගේ ඉදිරිපිටට ගියෙමු. ඔහුගේ මුහුණේ වූ සතුට දුටු මා තුළ සංවිධානය කෙරෙහි වූ බැඳීම තවත් අධික විය. ඔහු සියලු දෙනාගේම නම් අසා දැනගත්තේය. සමහර නම් අසා 'තේරුමක් තියන දෙමළ නම් මේ ළමයින්ට තියන්න තිබුණේ. බලන්ඩ මිලර්, ඩාම්පෝ කියලා මහ විරුවන්ගේ නම් තියනවා. පස්සේ කාලෙක මේ අය මොන රටේ ඉඳන් ඇවිල්ලද අරගල කෙරුවේ කියලා පර්යේෂණ කරන්ඩ පටන් ගනියි.' යැයි නායකතුමා අපේ වගකීම් භාරකරුට පැවසුවේය. පසුව අප වෙත පවරා ඇති වැඩකටයුතු ගැන විමසුවේය. 'වෙන මොනවද කියන්න තියෙන්නේ?' යැයි නායකතුමා අපගෙන් අසනවාත් සමඟම 'අපිව පුහුණුවට යවන්නකෝ' යැයි අපි එකම හඬින් සමූහ ගායනයක් සේ ඉදිරිපත් කළෙමු. 'ඔහෝ පුහුණුවට යවන්නේ නැතුවද ඔයාලව හංගගෙන තියාගෙන ඉන්නේ?' යැයි සිනාමුසුව පවසා ඔයාලා සේරම එකම කණ්ඩායමක් විදිහට පුහුණුවට යවන්ඩ බෑ. එහෙම වුණොත් වැඩ කටයුතුවලට බාධා වෙනවා. දහදෙනා බැගින් පුහුණු කඳවුරුවලට යවන්ඩ කටයුතු කරන්නම්. ' යැයි පවසා සමුගෙන ගියේය.

වගකීම් භාර සහෝදරිය දිනක් මා අමතා 'මම ඔයාට ග්‍රාමීය වැඩසටහන භාර වගකීම පවරලා ඔයා යවන්ඩ තීරණය කරලා තියනවා. එහෙදි ඔයත් එක්ක තව එක සාමාජිකාවක් විතරයි ඉන්නේ.' ඇය එම වැඩසටහන මට විස්තර කළාය. එදින මා මගේ බඩු බාහිරාදිය සමඟ එම ගමට පිටත් කර හැරියාය. සංවිධානයට බැඳී මාස ගණනාවක් තුළ මට පැවරූ කාර්යය කුරුල්ලෙකුගේ හිස මත තැබූ තල් ගෙඩියක් සේ විය. එහෙයින් මා තුළ ඇතිවූයේ බියක් සහ කැළඹීමකි. එය නිවැරදිව සිදු කිරීම පිළිබඳව මා තුළ බරපතල හැඟීමක්ද ඇති විය.

**මතු සම්බන්ධයි**




**සන්නස වෙළඳ දැන්වීම්**
**Sannasa Advrvertising**

**එස් ජයසිංහ / S Jayasinghe**
03 8707 4604 / 0402 025 516
email- sjturaus@optusnet.com.au

**අසෝක සුබසිංහ / Asoka Subasinghe** 0432 391 922
email - sannasanews@gmail.com

**Alpha Academy 2017**
Glen Waverley Classes

Grade 8 , 9 - Mathematics
Grade 8 , 9 - Science
Grade 8 ,9 - English
VCE Chemistry 1 , 2
VCE Biology 1 , 2
Other subjects - Upon request

- All students will be tested before enrolment , placed accordingly in the groups
- Unit Tests for all subjects
- VCE , SAC preparation guidance
- Ongoing updates for parents
- Multiple classes during week , enabling catch-up classes

**To request an application, please text student name, Class and school to**
**0457908918**

**JAPANESE**
By a qualified experienced teacher with proven results

**PREP to VCE**

- **Rapid Learning Strategies**
- **Special Attention for School Assessment Course work (SAC) according to VCAA Study Design.**
- **Exam Revision and Preparation for VCE written and oral exam.**

12+ Years' Experience in Teaching
Postgraduate Diploma of Education (Monash University) , B.A. (Hon)
Trained in Japan through a Japanese government scholarship to teach Japanese language.

**Contact Number: 0425 396 975**